ඔබට පෙර සිටි අය අතර තුවාල වූ මිනිසෙක් විය. ඔහු කලබල වී පිහියක් ගෙන එමගින් ඔහුගේ අත කපා ගත්තේය. මිය යන තෙක්ම රුධිරය නතර නොවීය. උත්තරීතර අල්ලාහ් මෙසේ පැවසීය: මාගේ ගැත්තා මා වෙත පැමිණියේය. ඔහුට ස්වර්ගය තහනම් කළෙමි

මෙම මස්ජිදයේ සිටිය දී ජුන්දබ් ඉබ්නු අබ්දුල්ලාහ් (රළියල්ලාහු අන්හු) තුමා අපට
පවසා සිටි බව හසන් තුමා විසින් වාර්තා කළ අතර හෙතෙම තවදුරටත් එය අපට පවසා සිටි වේලාවේ සිට අපි එය අමතක නොකළෙමු. එතුමා අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) සම්බන්ධයෙන් බොරුවක් පවසා ඇති බවට කිසිදු බියක් අප තුළ නැත. අල්ලාහ්ගේ දූතයාණෝ මෙසේ පවසා ඇත්තාහ: "ඔබට පෙර සිටි අය අතර තුවාල වූ මිනිසෙක් විය. ඔහු කලබල
වී පිහියක් ගෙන එමගින් ඔහුගේ අත කපා ගත්තේය. මිය යන තෙක්ම රුධිරය නතර නොවීය. උත්තරීතර අල්ලාහ් මෙසේ පැවසීය: මාගේ ගැත්තා මා වෙත පැමිණියේය. ඔහුට ස්වර්ගය
තහනම් කළෙමි."
[صحيح] [متفق عليه]

අපට පෙර සිටි අය අතර තුවාල වූ මිනිසෙක් සම්බන්ධයෙන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ දන්වා සිටියහ. ඔහු අත්වූ වේදනාව දරා නොගෙන කලබල වී පිහියක් ගෙන එමගින් ඔහුගේ අත කපා ගත්තේ. මරණය ඉක්මන් කර ගත්තේය. මිය යන තුරුම රුධිරය නතර නොවීය. උත්තරීතර අල්ලාහ් මෙසේ පැවසීය: මාගේ ගැත්තා මා වෙත පැමිණියේය. ඔහුට ස්වර්ගය තහනම් කළෙමි.

http://sunnah.global/hadeeth/si/show/2981